# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපාය , බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-2171635

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 1836/2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திகதி
Date — 12/12/2024
පැය 1150

## මාධ්‍ය නිවේදනය

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**<u>පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු ජන මාධ්‍ය වෙත යොමු කිරිම.</u>**

**01. 2024.12.11 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 02 | 02 | 43 | 160 | තඹ දඟර 01<br>යකඩ බැරල් 01 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථානයන් වෙත ඉදිරිපත් කර ඇත.

**02. මෙරට නිෂ්පාදිත ගිනි අවි සමඟ සැකකරුවන් තිදෙනෙක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා වාකරේ කඳවුර.**

2024.12.11 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා වාකරේ කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වාකරේ පොලිස් වසමේ කට්ටමුරු 04 කණුව ප්‍රදේශයේදී **මෙරට නිෂ්පාදිත ගිනි අවි තුනක් සමඟ සැකකරුවන් තිදෙනෙක් අත්අඩංගුවට** ගෙන වාකරේ පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 33, 35, 44 වයස්වල පසුවන කදිරවේලි ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

වාකරේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි

**03. රජයේ රක්ෂිත ප්‍රදේශයට අනවසරයෙන් අතුළු වී කැලෑ ප්‍රදේශය එළි කරමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කැබිතිගොල්ලෑව කඳවුර**

2024.12.10 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කැබිතිගොල්ලෑව කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් හොරොව්පතාන පොලිස් වසමේ මුක්කරවැව ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **රජයේ රක්ෂිත ප්‍රදේශයට අනවසරයෙන් ඇතුළු වී අක්කර ¾ ක පමණ ප්‍රමාණයක් එළි පෙහෙලි කරමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට** ගෙන හොරොව්පතාන බීට්ටු වන නිලධාරි කාර්යාලය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 44 හා 45 වයස්වල පසුවන හොරොව්පතාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

**04. රජයේ රක්ෂිත ප්‍රදේශයට අනවසරයෙන් අතුළු වී කැලෑ ප්‍රදේශය එළි කරමින් සිටි සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා වාකරේ කඳවුර**

2024.12.11 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා වාකරේ කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වාකරේ පොලිස් වසමේ කදිරවේලි රක්ෂිත ප්‍රදේශයේදී වැටලීම් සිදුකර **රජයේ රක්ෂිත ප්‍රදේශයට අනවසරයෙන් ඇතුළු වී කැලෑ එළි පෙහෙලි කරමින් සිටි සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට** ගෙන වාලච්චේන අඩවි වන නිලධාරි කාර්යාලය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 32, 46 හා 56 වයස්වල පසුවන කදිරවේලි හා සංගමන්කන්ද ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**